සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2025 ජනවාරි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2025-02-02
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- අයදුම්කරුවන්ට උපදෙස් (අවධානයෙන් කියවිය යුතුය):

(1) *දී ඇති කාලය : කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන්, **එක් භාෂාවකින් පමණක්**, ඔබ වෙත සපයන ලද පොත්වල උත්තර ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**රාමත්,** ශ්‍රී ලංකාවේ පුරවැසියෙකි. ඔහු, 2023 සැප්තැම්බර් 25 දින ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය විය. නමුත්, ඔහුගේ මවගේ හදිසි අභාවය නිසා ඔහුට 2024 මාර්තු 15 දින, නැවත ලංකාවට පැමිණීමට සිදු වූ අතර, 2024 මාර්තු 25 දින ඔහු ශ්‍රී ලංකාවෙන් නැවත පිටත්ව ගොස් ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, 2023/24 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා **රාමත්ගේ වාසිකභාවය පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

(a) සෙවිලි තහඩු ආනයනය කර ඒවා දේශීය වෙළෙඳපොළේ විකිණීමේ නිරතව සිටින **මාලා ට්‍රේඩර්ස්,** සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද [Social Security Contribution Levy (SSCL)] සඳහා ලියාපදිංචි වී සිටී. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එහි පිරිවැටුම රු.165,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**මාලා ට්‍රේඩර්ස් විසින් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ගණනය කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම, සීමාසහිත XYZ පොදු සමාගමෙහි** (කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකි) එක් කොටසක් රු.50/- බැගින් කොටස් 100,000 හිමිකරගෙන සිටියි. සමාගමේ අධ්‍යක්ෂකවරු එම ආයෝජනය විකුණා දැමීමට තීරණය කර තිබේ. ඒ අනුව, 2024 මාර්තු 15 දින එක් කොටසක් රු.240/- බැගින් කොටස් 50,000 ක් කොළඹ කොටස් හුවමාරුවේ තැරව්කරුකරුවෙකු හරහා විකුණන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම විසින් ගෙවිය යුතු කොටස් හුවමාරු බද්ද (Share Transaction Levy) ගණනය කරන්න.**

(ලකුණු 02)
(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සිරිසේන** සහ **ජයදේව, ජය ශ්‍රී ට්‍රේඩර්ස්** හි හවුල්කරුවන් වන අතර, ඔවුහු පිළිවෙලින් 2 : 1 අනුපාතය යටතේ ලාභා'ලාභ බෙදාගනිති. **සිරිසේන, ජය ශ්‍රී ට්‍රේඩර්ස්** හි ඔහුගේ ලාභ කොටස, ඔහුගේ පුතා සමඟ සමසමව බෙදා ගැනීමට තවත් හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹීමට ඔහු සැලසුම් කරයි. මෙම සැලසුමෙහි ආදායම් බදු බලපෑම දැනගැනීමට **සිරිසේන** ට අවශ්‍ය වී තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සිරිසේන** සහ ඔහුගේ පුතා අතර ඇති ගිවිසුමේ ආදායම් බදු බලපෑම්, *ඒ.ඒ. ඩාවුඩ්බෝයි එදිරිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (A.A. Davoodbhoy Vs CGIR)* නඩු තීන්දුව සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන් පදනම් කර ගනිමින් **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

(a) 2024 මාර්තු මාසය තුළදී, **සීමාසහිත Crown Holdings පොදු සමාගමෙහි** පහත සඳහන් ගෙවීම් සිදුකර තිබේ:

(1) වාසිකයෙකු වන **සිල්වා** මහතාට රු.120,000/- ක කුලිය ගෙවීම.

(2) ප්‍රවර්තන වර්ෂයේ ලාභයෙන් ගෙවන ලද අතුරු ලාභාංශ, රු.12,000,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

එක් එක් ගෙවීම මත **සීමාසහිත Crown Holdings පොදු සමාගම** විසින් අඩුකළ යුතු අත්තිකාරම් ආදායම් බද්ද [Advance Income Tax (AIT)] **ගණනය කරන්න.** (ලකුණු 02)

(b) අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] ක්‍රමය යටතේ සේවායෝජකයෙකුගේ වගකීම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

එකතු කළ අගය මත බද්ද [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි පුද්ගලයෙකු වන **සීමාසහිත Sky Kids (පෞද්ගලික) සමාගම**, සෙල්ලම් බඩු නිෂ්පාදනය කර විකිණීමේ නිරතව සිටියි.

පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් උපුටාගෙන තිබේ:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව තුළ සිදුකළ විකුණුම්වල විස්තර (VAT රහිතව) පහත දැක්වේ:

| | රු. |
|---|---|
| මෘදු සෙල්ලම් බඩු අපනයන විකුණුම් | 137,660,000 |
| මෘදු සෙල්ලම් බඩු දේශීය විකුණුම් | 87,764,000 |

(2) කාර්තුව තුළදී සමාගම පහත දැක්වෙන යෙදවුම් බදු ගෙවා තිබේ:

| | රු. |
|---|---|
| අමුද්‍රව්‍ය ආනයනය මත | 12,375,000 |
| අමුද්‍රව්‍ය දේශීයව මිලට ගැනුම් මත | 765,000 |
| කාර්යාල වියදම් මත | 124,000 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද (input VAT) රු.48,000/- කි.

(4) සමාගම, කාර්තුව තුළදී මාසික එකතු කළ අගය මත බදු වාරික වශයෙන් රු.500,000/- ක් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 18% ක් ලෙස සලකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් වන **සීමාසහිත Star Villa (පෞද්ගලික) සමාගම**, 2023/24 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය (Statement of Estimated Tax Return), රු.600,000/- ක ඇස්තමේන්තුගත බදු බැඳියාවක් සමඟ ඉදිරිපත් කර තිබේ. කෙසේවෙතත්, අවසාන බදු ගණනය කිරීම අනුව සමාගම බදුකරණ අලාභයක් දරා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2023/24 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය ගොනු කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) 2023/24 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික ගෙවීමට නියමිත දින **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) 2023/24 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ආදායම් වාර්තාව ගොනු කිරීමට අවශ්‍ය වන්නේදැයි **සඳහන් කරන්න.** *(ඔබගේ උත්තරය සාධාරණීකරණය කරන්න.)* (ලකුණු 02)

(d) "බලයලත් නියෝජිතයෙකු (authorized representative)" විය හැකි පුද්ගලයින් දෙදෙනෙකු(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**නසීර් සහ ඩේවිඩ්, "Winners"** හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් වන අතර, කළමනාකරණ උපදේශන සේවා සැපයීමේ නිරතව සිටී. ඔවුන් පිළිවෙලින් 2 : 1 අනුපාතයට ලාභා'ලාභ බෙදා ගැනීමට එකඟ වී සිටිති. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | රු. | රු. |
|---|---|---|
| ආදායම්: | | |
| උපදේශන සේවා | | 31,340,000 |
| කුලී ආදායම | | 216,000 |
| ස්ථාවර තැන්පතු මත පොලිය (ශුද්ධ) | | 5,700 |
| | | 31,561,700 |
| වියදම්: | | |
| වැටුප් | 12,870,000 | |
| ගොඩනැගිල්ලේ වරිපනම් | 30,000 | |
| ගිණුම්කරණ ක්ෂය | 48,000 | |
| පරිත්‍යාග | 75,000 | |
| වෙනත් වියදම් | 3,564,000 | (16,587,000) |
| ශුද්ධ ලාභය | | **14,974,700** |

පහත දැක්වෙන තොරතුරුද සපයා ඇත:

(1) වැටුප් තුළ හවුල්කරුවන්ට ගෙවන ලද පහත සඳහන් වැටුප් ද ඇතුළත් වේ:

**නසීර්** : රු.1,800,000/-

**ඩේවිඩ්** : රු.2,400,000/-

(2) 2021 දෙසැම්බර් මාසයේ රු.400,000/- ක පිරිවැයකට මිලදී ගත් පරිගණක සඳහා ගිණුම්කරණ ක්ෂය අදාල වේ. අනෙකුත් සියළු වත්කම්, ගිණුම්කරණ අරමුණු සඳහා මෙන්ම බදු අරමුණු සඳහා ද සම්පූර්ණයෙන් ක්ෂය කර තිබේ.

(3) ගොඩනැගිල්ලේ අඩක් වෙනත් පාර්ශවයකට කුලියට ලබාදී තිබෙන අතර, සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහාම වරිපනම් ගෙවා ඇත්තේ හවුල් ව්‍යාපාරයයි.

(4) රු.75,000/- ක මුදල් පරිත්‍යාගයක් ගමේ පන්සලට සිදුකර තිබේ.

(5) වෙනත් වියදම්, බදු අරමුණු සඳහා ඉඩදෙනු ලැබේ.

ස්ථාවර තැන්පතු පොලිය මත අන්තිකාරම් ආදායම් බද්ද [Advance Income Tax (AIT)] / රඳවා ගැනීමේ බද්ද [Withholding Tax (WHT)] අඩුකර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023/24 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සිමාසහිත Publications (පෞද්ගලික) සමාගම**, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමකි. එය ශ්‍රී ලංකාවේ විශාල සමූහ ව්‍යාපාරයක ප්‍රකාශන හස්තයයි.

**සිමාසහිත Publications (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අදාල වේ:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සියළු වියදම් අයකිරීමෙන් හා සියළු ආදායම් බැර කිරීමෙන් පසු බදු පෙර ශුද්ධ ලාභය රු.103,450,000/- ක් විය. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුම රු.934,600,000/- ක් විය.

(2) වෙනත් ආදායම්වල පහත දෑ ඇතුළත් වේ:

| | රු. |
|---|---|
| ලාභාංශ ආදායම (රඳවාගැනීමේ බදු අඩුකළ පසු) | 166,600 |
| ස්ථාවර තැන්පතු මත පොලී ආදායම (දළ) | 654,000 |
| | **820,600** |

(3) පරිපාලන හා බෙදාහැරීමේ වියදම්වල පහත දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය අයකිරීම රු.63,275,000/- කි.
- යන්ත්‍රයක් විකිණීම නිසා දැරූ ගිණුම්කරණ අලාභය රු.543,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.16,327,000/- කි.
- LPL ක්‍රිකට් තරඟාවලිය සඳහා අනුග්‍රාහකත්වය රු.4,000,000/- කි.

- වර්ෂය තුළදී, නව ඩිජිටල් සන්නිවේදන තාක්ෂණයන් පිළිබඳ සමුළුවකට සහභාගී වීම සඳහා අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් ඇමරිකාවට යවන ලදී. සමාගම, සහභාගීවීමේ ගාස්තු වශයෙන් රු.300,000/- ක් සහ ගුවන් ටිකට්පත් හා නවාතැන් වෙනුවෙන් රු.1,000,000/- ක් දරණ ලදී.

- සමාගම, ශ්‍රී ලංකා SOS ළමා ගම්මානවල දැන්වීම් තොම්ලේ පළකරවා දී තිබේ. ඒවායේ පිරිවැය රු.600,000/- කි. තවද, සමාගම රු.500,000/- ක් කැළණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කර තිබේ.

(4) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වත්කම් (පිරිවැයට) | 2023 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.) | එකතු කිරීම් (රු.) | ඉවත් කිරීම් (රු.) | 2024 මාර්තු 31 දිනට ශේෂය (රු.) |
|---|---|---|---|---|
| ඉඩම | 100,000,000 | - | - | 100,000,000 |
| ගොඩනැගිලි | 96,000,000 | 600,000 | - | 96,600,000 |
| පිරියත හා යන්ත්‍ර | 45,000,000 | 8,000,000 | 2,500,000 | 50,500,000 |
| කාර්යාල උපකරණ | 3,254,000 | - | - | 3,254,000 |
| පරිගණක | 4,250,000 | - | - | 4,250,000 |
| | **248,504,000** | **8,600,000** | **2,500,000** | **254,604,000** |

- 2023 අප්‍රේල් 01 දිනට පැවති සියළු වත්කම්, 2020/21 තක්සේරු වර්ෂයේදී අත්පත් කරගත් ඒවා වන අතර, අත්පත් කරගත් දින සිට ප්‍රාග්ධන දීමනාවන්ට හිමිකම් පා තිබේ.
- වර්ෂය තුළදී, සමාගම, කාර්යාල පරිශ්‍රය වටා තාප්පයක් ඉදිකොට තිබෙන අතර, එය වර්ෂය තුළදී ගොඩනැගිල්ලට එකතුකිරීම් ලෙස දක්වා තිබේ.
- 2023 දෙසැම්බර් මාසයේදී, යන්ත්‍රයක් රු.2,000,000/- කට විකුණන ලද අතර, විකුණූ යන්ත්‍රය නැවත ප්‍රතිස්ථාපනය සඳහා නව යන්ත්‍රයක් වර්ෂය තුළදී මිලට ගන්නා ලදී.

(5) සේවයෙන් ඉවත් වූ සේවකයෙකුට පාරිතෝෂික වශයෙන් රු.1,600,000/- ක මුදලක් ගෙවා තිබේ.

(6) සමාගම, 2023/24 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු කාර්තුමය වාරික වශයෙන් රු.20,000,000/- ක් ගෙවා තිබේ.

(7) බැංකුව, පොලී ආදායම මත 5% බැගින් අත්තිකාරම් ආදායම් බදු [Advance Income Tax (AIT)] / රඳවාගැනීමේ බදු [Withholding Tax (WHT)] අඩුකර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023/24 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත Publications (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කළ හැකි ආදායම,

(b) බදු අයකළ හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද / (වැඩිපුර ගෙවූ බද්ද).

***(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.)*** (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

මෘදුකාංග ඉංජිනේරුවරයෙකු වන **සාලිය පෙරේරා,** ශ්‍රී ලංකාවේ පිළිගත් මෘදුකාංග සංවර්ධන සමාගමක සේවය කරයි.

2023/24 තක්සේරු වර්ෂයට (**මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සාලිය පෙරේරා** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) **සේවා නියුක්තියෙන් ලද ආදායම:**

- දළ වැටුප - මාසිකව රු.300,000/- කි.
- පසුගිය වසරේ කාර්යසාධනය පදනම් කර ගනිමින් 2023 අප්‍රේල් මාසයේදී ගෙවන ලද ප්‍රසාද දීමනාව රු.450,000/- කි.
- සමාගම, මාසිකව රු.60,000/- ක ගමන් වියදම් දීමනාවක් ගෙවා තිබේ.
- වාහන නඩත්තු වියදම් රු.100,000/- ක් දක්වා සමාගම විසින් ප්‍රතිපූරණය කරයි. වර්ෂය තුළදී ඔහුට රු.80,000/- ක් සමාගම විසින් වාහන නඩත්තු වියදම් ලෙස ප්‍රතිපූර්ණය කර තිබේ.
- ඔහුගේ මාසික ජීවිත රක්ෂණ වාරිකය වන රු.10,000/-, සමාගම විසින් ප්‍රතිපූරණය කර තිබේ. මෙම ප්‍රතිලාභය සමාගමේ විධායක කාර්ය මණ්ඩලයට පමණක් හිමි වේ.
- 2023 අප්‍රේල් මාසයේදී, සේවා නියුක්තික කොටස් යෝජනා ක්‍රමයක් (Employee Share Option Scheme) යටතේ ඔහුට සමාගමේ කොටස් 1,000 ක් ලැබුණි. විභජනය කරන අවස්ථාවේදී, කොටසක වෙළෙඳපොළ වටිනාකම රු.200/- ක් වූ අතර, සාලිය කොටසකට රු.50/- බැගින් ගෙවීය.
- වර්ෂය සඳහා අඩුකරන ලද අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද [Advance Personal Income Tax (APIT)] රු.918,000/- කි.

(2) ඔහුට අයත් පොල් වත්තක් කුරුණෑගල පිහිටා ඇති අතර, වර්ෂය සඳහා එහි ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | රු. | රු. |
|---|---|---|
| පොල් විකිණීමෙන් ලද ආදායම | | 1,843,000 |
| අඩු කළා: වියදම්: | | |
| පොහොර | 613,000 | |
| මුරකරුගේ වැටුප | 300,000 | |
| ක්ෂය | 100,000 | |
| දුරකතන බිල්පත් (50% ක් සාලියගේ පුද්ගලික ඇමතුම් ගාස්තු වේ) | 60,000 | (1,073,000) |
| **ශුද්ධ ලාභය** | | **770,000** |

ක්ෂය අයකර තිබෙන්නේ 2021/22 තක්සේරු වර්ෂයේදී රු.1,200,000/- ක පිරිවැයකට මිලට ගත් යන්ත්‍රය වෙනුවෙනි.

(3) වර්ෂය තුළදී, ඔහු ඇතැම් අවස්ථානුකූල (ad-hoc) තොරතුරු තාක්ෂණ සේවාවන් බාරගෙන තිබුණු අතර, එම සේවාවන්ගෙන් රු.435,000/- ක ආදායමක් උපයා තිබේ.

(4) සාලිය ට වාණිජ බැංකුවක රු.1,000,000/- ක ස්ථාවර තැන්පතුවක් තිබේ. එය 2024 මාර්තු මාසයේදී කල් පිරුණු අතර, බැංකුව විසින් 5% ක රඳවාගැනීමේ බදු [Withholding Tax (AIT)] අඩු කළ පසු රු.114,000/- ක් ඔහුගේ ඉතිරිකිරීමේ ගිණුමට බැර කර තිබේ.

(5) සාලිය නිල ලැයිස්තුගත කොටස්වල ආයෝජන කිහිපයක් සිදුකර තිබෙන අතර, 2024 මාර්තු මාසයේදී ලැබුණු ශුද්ධ ලාභාංශය රු.44,200/- කි.

(6) සාලියට පාරම්පරිකව උරුම වූ නිවසක් රත්නපුරයේ පිහිටා ඇති අතර, එය 2023 ජූනි 01 දින සිට මාසිකව රු.25,000/- ක කුලියකට පවුලකට කුලියට දී තිබේ. කුලී නිවැසියාට නිවස බාර දීමට පෙර ඔහු නිවස පිළිසකර කිරීමට රු.73,000/- දරා තිබේ.

(7) වර්ෂය තුළදී, ඔහු මුදලින් රු.100,000/- ක් සහ රු.25,000/- ක් වටිනා භාණ්ඩ, අනුමත පුණ්‍යායතනයක් වන වැඩිහිටි නිවාසයකට පරිත්‍යාග කර තිබේ.

(8) ඔහු, 2023/24 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාරික ගෙවීම් වශයෙන් රු.160,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023/24 තක්සේරු වර්ෂය සඳහා සාලියගේ පහත සඳහන් දෑ තක්සේරු කරන්න:

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

*(සැ.යු: යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |